වික්ටර් අයිවන්ට පිළිතුරක්

# තවත් බොහෝ දේ තිබේ

**- උවිඳු කුරුකුලසූරිය**

රාවය ප්‍රධාන සංස්කාරක වික්ටර් අයිවන් පසුගිය දෙසතිය තුළ පුරා පිටු දෙකකටත් වඩා දිග ලිපි පෙලක් 'සාපරාධී අපහාස නීතිය - දේශපාලනය හා ජනමාධ්‍යය' නමින් පල කළේය. පළමු ලිපියේ සැහෙන ප්‍රමාණයක් වැය කර ඇත්තේ ලිපියට ප්‍රවේශවීම සඳහා ඔහුගේ මිත්‍රයෙකු ලෙස නම් කර ඇති නිර්නාමික මූලාශ්‍රයක් සමඟ කරන ලද සංවාදයක් සඳහාය.
මම ඉන් කොටසක් උපුටා දක්වමි.

*'කතුවරුන්ගණනාවකට එරෙහිව නඩු පවරපු බව ඇත්ත. ඔවුන් වින්තිකරුවන් ලෙස එම නඩුවලට මුහුණ දුන් බවත් ඇත්ත. ඔවුන් ඒ නඩුවලට පෙනී සිටියා මිස සාපරාධී අපහාස නීතියට එරෙහිව ඔවුන් මොනම අරගලයක්වත් කළේ නැහැ.'*

*'එගොල්ලො කළේ නැතුවට ඔයා කළානේ.' ඔහු කීවේය.*

*ඔව්. මම මට එරෙහිව පවරන ලද නඩුවලට මුහුණ දෙන අතර, සාපරාධී අපහාස නීතියට එරෙහිවත්, එම නීතියේ භාවිතයට එරෙහිවත් අවුරුදු 10කට ආසන්න කාලයක් පුරා නෛතික අරගලයක් කළා. සාපරාධී අපහාස නීතිය අහෝසි කෙරුණේ එම නෛතික අරගලය විසින් සාපරාධී අපහාස නීතියේ පැවැත්ම හිරකර තිබුණු අවස්ථාවක. මා ජනමාධ්‍යවේදියෙක් බව ඇත්ත. ඒත් සාපරාධී අපහාස නීතියට එරෙහිව මගේ අරගලය ඒක පුද්ගල අරගලයක් ලෙස මිස, ජනාමධ්‍යවේදීන්ගේ පොදු අරගලයක් ලෙස සලකන්න බැහැ. එම අරගලයේ යහපතට හේතුවන මොනම දායකත්වයක්වත් ජනමාධ්‍යවේදීන්ගේ හෝ ජනමාධ්‍ය සංවිධානවලින් ලැබුණේ නැහැ. අඩුම වශයෙන් ජිනීවා තීන්දුවෙන් පසුවවත් එම තීන්දුව ක්‍රියාත්මක කරවීමටවත් ජනමාධ්‍යවේදීන් හෝ ජනමාධ්‍ය සංවිධාන කිසිම මැදිහත්වීමක් සිදුකර නැහැ. ඒ නිසා සාපරාධී අපහාස නීතියට එරෙහිව මා විසින් කරන ලද දිග්ගැසුණු නෛතික අරගලය ජනමාධ්‍යවේදීන්ගේ පොදු ගිණුමට බැර කරන්න මා කැමති නැහැ.'*

*මා අවසාන වශයෙන් දෙන ලද පිළිතුර ඔහු විශ්මයට පත් කිරීමට හේතු වූවා සේ ම ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය සංස්කෘතිය ගැන කලකිරීමකින් කතා කරන තැනකට තල්ලු කිරීමට ද හේතුවිය.*

වික්ටර්ගේ නිර්නාමික මූලාශ්‍රය විශ්මයට පත්වූවා සේම මමද එම ලිපි පෙල කියවීමෙන් විශ්මයට පත්වුනෙමි. ඔහු කරුනු ඉදිරිපත් කර ඇති ආකාරය අනුව තොරතුරු මදකම හේතුවෙන් වික්ටර්ගේ නිර්නාමික මූලාශ්‍රය විශ්මයට පවත්වන්නට ඇත. මා විශ්මයට පත්වූයේ තොරතුරු දන්නා බැවිනි.

වික්ටර් පවසා ඇත්තේ සාපරාධී අපහස නීතිය ඉවත් කර ගැනීම සඳහා කරන ලද අරගලයට මොනම ජනමාධ්‍ය සංවිධානයකවත් සහය නොලැබුණු බවය. එය තමන් තනිව සටන් කර ජයග්‍රහණය කල සටනක් බවය.

සාපරාධී අපහාස නීතියෙන් වඩාත්ම බැට කෑ ජනමාධ්‍යවේදියා වශයෙන් වික්ටර් කියා ඇති බොහෝ දේ ඇත්තය. ඔහු එයින් මහත් පීඩා වින්දේය. ඒ නිසාම මාද බොහෝ දිනවල ඔහු සමඟ උසාවි ගොස් තිබේ. තවමත් ඔහු වෙනුවෙන් මාගේ නමින් තැබූ ඇප මුදල් උසාවියේ ඇත. එහෙත් ඔහුගේ ලිපියේ මා එකඟ නොවන කරුණකට ප්‍රතිචාර දක්විය යුතුය.

මාධ්‍ය සංවිධාන කල අරගලය පිළිබඳව විධිමත් පර්යේෂයක් කිරීමට මට වෙලාවක් නැත. මෙය ක්ෂණික ප්‍රතිචාරයකි. එහෙයින් මතකයෙන් සහ ලිඛිත සාක්ෂි ඇසුරෙන් එයට මාධ්‍ය සංවිධානයන් කල සටන පිළිබඳව දක්වමි.

*මෙරට මාධ්‍ය සංවිධාන ප්‍රථම වරට සාපරාධී අපහස නීතියට එරෙහිව විධිමත් ලෙස එක් රැස්වූයේ සන්ඩේ ටයිම්ස් ප්‍රධාන සංස්කාරක සිංහරත්නතුංගට එරෙහි නඩු තීන්දුවෙන් පසුවය. නඩු තීන්දුවෙන් මසකට පසුව කොළඹ හොලිඩේ ඉන් හෝටලයේදී නිදහස් මාධ්‍ය ව්‍යාපාරයත්, කර්තෘ සංසදයත්, ප්‍රකාශකයින්ගේ සංගමයත් එක්ව සාපරාධී අපහාස නීතියට එරෙහිව සම්මන්ත්‍රණයක් පවත්වන ලදි. මගේ මතකයේ හැටියට ඒ 1997 ජූලි මාසයේදීය. එය සංවිධානය කර තිබුණේ 'ෆ්‍රෙන්ඩ්ස් ඔෆ් මීඩියා' නම්වූ ඒවෙලේ තනාගත් සංවිධානය මගිනි. රාවයෙන් එයට සහභාගිවූයේ වික්ටර් සහ මාය. එහිදී සුනන්ද දේශප්‍රිය, වික්ටර් අයිවන්, අජිත්*

*සමරනායක හා රනිල් වික්‍රමසිංහ අදහස් දැක්වූහ. රනිල්ගේ මාධ්‍ය ප්‍රතිපත්තිය එළිදැක්වූයේද එදින වන අතර සාපරාධී අපහස නීතිය ඉවත් කරන බවට ඉන් පොරොන්දුවී තිබිණ.*

*එහි ප්‍රතිඵලය ලෙස ඉහත කී සංවිධාන තුනත් ශ්‍රී ලංකා වෘත්තීය පත්‍ර කලාවේදීන්ගේ සංගමයත් 1998 අප්‍රේල් 27 හා 28 වන දින දෙක තුල කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ රැස්වී අවසානයේදී 'කොළඹ ප්‍රකාශණය' නමින් ප්‍රකාශණයකට අත්සන් තබන ලදී. එම ප්‍රකාශණයේ  පෙරවදනෙන් කොටසක් උපුටා දක්වමි.*

*'අදහස් ප්‍රකාශ කිරීමේ සහ මාධ්‍ය නිදහසේ ප්‍රගතියට සමගිය සහ සහයෝගය සඳහා වූ වගකීම නැවත අවධාරණය කිරීමක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, ශ්‍රී ලංකා පුවත්පත් කර්තෘන්ගේ සංසදය සහ පුවත්පත් ප්‍රකාශකයන්ගේ සංගමය විසින් මාධ්‍ය නිදහස සහ සමාජ වගකීම පිළිබඳ වූ කොළඹ ප්‍රකාශය ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ලංකා වෘත්තීය පුවත්පත් කලාවේදීන්ගේ සංගමය මෙම සාකච්ඡාවට සහභාගි වූ අතර විධායක කමිටුවේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ප්‍රකාශයට අත්සන් තබන බව දන්වා ඇත.*

*ඉහත සඳහන් වූ සංවිධාන සමඟ ලෝක පුවත්පත් සංගමය හා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මෙය සංවිධානය කළේය. සම්මන්ත්‍රණයේදී අභ්‍යන්තර අර්බුද වාර්තාකරණය,* ***සාපරාධී අපහාසය*** *හා විද්‍යුත් මාධ්‍යයන්ගේ නැඹුරුතාවන් ගැන සලකා බලන ලදී. පොදු රාජ්‍ය මණ්ඩලීය ඉතිහාසයේ කර්තෘන්, ප්‍රකාශකයන්, මාධ්‍යවේදීන්, මානව හිමිකම් ක්‍රියාකාරීන් හා උගතුන් මාධ්‍ය නිදහස හා සමාජ වගකීම පිළිබඳ ප්‍රශ්න සාකච්ඡා කිරීමට එකම ස්ථානයකට රැස්වී පොදු තලයක ප්‍රතිසංස්කරණයන් ගැන එකඟතාවකට පැමිණි ප්‍රථම අවස්ථාව මෙය විය.*

*නියෝජ්‍ය මාධ්‍ය ඇමති අනුර ප්‍රියදර්ශන යාපා මහතා සහ විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා සමාරම්භක සැසිය ඇමතූහ. මූලික කථාව පැවැත්වූ දක්ෂින අප්‍රිකානු මාධ්‍ය ආයතනයේ විධායක අධ්‍යක්ෂිකා ජිනට් මිනි, මාධ්‍යවේදීන් සුරැකීමේ කමිටුවේ ආසියානු වැඩසහටන් සම්බන්ධීකාරක ලින් නිවුමාන්, 'ආටිකල් 19හි' එලිසබත් නිසාන්, ලෝක පුවත්පත් නිදහස කමිටුවේ සභාපති කශ්රොව් ඉරානි, පොදු රාජ්‍ය මණ්ඩලීය පුවත්පත් සංගමයේ ලින්ඩ්සි රෝස්, ඉන්දියාවේ ප්‍රසාභාරති පුවත්පත් අධ්‍යක්ෂ ජෝර්ජ් වර්ගීස් සම්මන්ත්‍රණයට සහභාගී වූ විදේශ නියෝජිතයෝ වූහ. එම විදේශ නියෝජිතයෝ මාධ්‍යන්ට සම්බන්ධ නීතිමය හා ව්‍යවස්ථාමය රාමුව පිළිබඳ වූ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවද හමු වූහ.*

සාපරාධී අපහාස නීතිය ඇතුලු ජනමාධ්‍යට සම්බන්ධ ආණ්ඩුවේ මැදිහත්වීම් වැළැක්වීමට නම් මාධ්‍ය ස්වයං නියාමන යාන්ත්‍රණ සකස්කර ගත යුතු බවට ප්‍රථම වරට මෙරට මාධ්‍ය සංවිධාන එකඟතාවයකට ආවේ එහි ප්‍රතිඵලයක් ලෙසය. එවකට ජනමාධ්‍යවේදීන්ට තමන් විසින්ම තනාගත් ආචාරධර්ම පද්ධතියක්වත් නොතිබුණි. පසු කලෙක ආචාරධර්ම පද්ධතිය, පුවත්පත් පැමිණිලි කොමිසම හා ජනමාධ්‍ය විද්‍යාලය පැමිණියේ එහි ප්‍රතිඵලයක් ලෙසය.

මීට අමතරව තවත් බොහෝ කරුනු දැක්විය හැක. සාපරාධී අපහාස නීතියන් බැට කෑ තවත් සංස්කාරකවරුන් දෙදෙනෙකුවන සන්ඩේ ලීඩර් සංස්කාරක ලසන්ත වික්‍රමතුංගගෙන් හා සන්ඩේ ටයිම්ස් සංස්කාරක සිංහරත්නතුංග ගෙන් අසාදූනගත් පරිදි කර්තෘ සංසදය ලෙස සාපරාධී අපහාස නීතිය ඉවත්කර ගැනීම සඳහා දේශපාලඥයින් ගණනාවක් හමුවී තිබේ. රවුෆ් හකීම්, කථානායක අනුර බණ්ඩාරනායක, රනිල් වික්‍රමසිංහ, ශ්‍රීමනී ඇතුලත් මුදලි, ජනතා විමුක්ති පෙරමුණ ආදිය ඒ අතර වේ. ඊට අමතරව නීතිපතිවරයා ලෙස සරත් නන්ද සිල්වාද හමුවී තිබේ. මේ හමුවීම් සඳහා සිංහ, ලසන්ත, වික්ටර්, උපාලි, සිරිරණසිංහ, මනික් හා සුනන්ද යන සංස්කාරකවරුන් වරින් වර කණ්ඩායම් වශයෙන් ගොස් තිබේ. ඇත්ත වශයෙන්ම මගේ තක්සේරුව අනුව මේ සියලු සංවිධාන එක්රැස් කරමින් විශිෂ්ඨතම වැඩකොටසක් කරන ලද්දේ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ වරුන කරුණාතිලකය.

මේ හමුවීම් වල ප්‍රතිඵලයක් ලෙස සාපරාධී අපහසය ඉවත්කරවා ගැනීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හැර අනෙකුත් පක්ෂවල අත්සන් ලබාගත් බව සිංහ මා සමඟ කීවේය.

චන්ද්‍රිකා විසින් පරිවාස කාලයේ පාර්ලිමේන්තුව විසුරුවා හරින විට රනිල් වික්‍රමසිංහගේ නමින්වූ සාපරාධී අපහාස නීතිය ඉවත්  කල යුතු බවට පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් විවාද වෙමින් තිබිණ. එය ස්ථිර කරන ලද්දේ වාසුදේව නානායක්කාර විසිනි.

වික්ටර් අයිවන්ට එරෙහි නඩුවක්, ඔහු විසින්ම පැමිණිලි කර වැරදිකරුවෙකුවූ විනිශ්චයකරුවෙකු ඉදිරියේ ගැනීම ගැන ඔහු සඳහන් කර තිබේ. එයටද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය දීර්ඝ පුවත්පත් නිවේදනයක් මගින් 2001 මැයි 11 දින දැඩි ලෙස විරෝධය පල කර ඇත. *(බලන්න ජාත්‍යන්තර මාධ්‍ය සංවිධානයක් වන IFEX වෙබ්අඩවිය (ifex.org) )* තවදුරටත් වික්ටර් අයිවන් මෙසේ කියයි.

'කමිටුවේ තීන්දුව (ජිනීවා) හා මා ඒ වෙනුවෙන් කරන ලද අරගලය අගය කරමින් අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස වෙනුවෙන් ක්‍රියාකරන සංවිධාන තුනක් ප්‍රකාශ නිකුත් කළේය. IFJ

සංවිධානය ප්‍රකාශ කළේ එම තීන්දුව සාපරාධී අපහස නීතිය බලපාන අනෙකුත් සියලු රටවලටද අදාල බවය. එහෙයින් ලංකාවේ මාධ්‍ය සංවිධාන ඒ ගැන ප්‍රසිද්ධියේ එක වචනයක්වත් කතා කළේ නැත.' නැවතත් IFEX වෙබ් අඩවියට ගිය හොත් 2004 සැප්තැම්බර් 3 වන දින නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඒ පිළිබඳව නිකුත් කළ නිවේදනය බලාගත හැකි වනු අත. එම තීන්දුව ලැබෙන විට වික්ටර් අයිවන් නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ කැඳවුම් කරුය. ප්‍රකාශය නිකුත් කර ඇත්තේ ප්‍රකාශක ලෙස සුනන්ද දේශප්‍රියය.

සාපරාධී අපහාස නීතියට එරෙහිව මෙන්ම ජනමාධ්‍ය නිදහස වෙනුවෙන්ද වික්ටර් අයිවන් විශාල වැඩ කොටසක් කර ඇති බව අවිවාදිතය. එහෙත් ඒ සියල්ල තමන් තනිවම කළ ඒවා ලෙස සැලකීම හොඳ නැත. අනෙක් අතට පසුගිය වසර වන තෙක් වික්ටර් අයිවන් නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ ලේකම්, කැඳවුම්කරු, උපලේකම් ආදී විවිධ තනතුරු දරා ඇත. එමෙන්ම කර්තෘ සංසදයේද සාමාජිකයෙකු ලෙස කටයුතු කර ඇත. ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කර ඇත. මාධ්‍ය සංවිධාන යමක් නොකළා යැයි කියමන සත්‍යයක් නම් එයට ඔහුද වගකිව යුතුය.

සාපරාධී අපහාස නීතිය අහෝසි කරන බවට රනිල් වික්‍රමසිංහ සිහ මැතිවරණ ප්‍රකාශය මගින් පොරොන්දු වී තිබිණි. රනිල් සාපරාධී අපහාස නීති ඉවත් කිරීමට කටයුතු කළේ ඒ අනුවය. සාපරාධී අපහාස නීතිය ඉවත් කිරීමට නම් ස්වයං නියාමන පද්ධතියක අවශ්‍යතාවය තේරුම් ගනිමින් පුවත්පත් මණ්ඩලය අකර්මන්‍ය කොට ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයත්, ජනමාධ්‍ය විද්‍යාලයත්, පුවත්පත් පැමිණිලි කොමිසමත් ආරම්භ කිරීමට සහයෝගය ලබා දුන්නේ ද රනිල් වික්‍රමසිංහය. එම ආයතන සියල්ල ජනමාධ්‍යවේදීන්ගේ සංගම් හා ප්‍රකාශකයන්ගේ සංගමය විසින් පවත්වාගෙන යනු ලබන ඒවාය. එම ක්‍රියාවලියද තර්කානුකූල අවසානයකට ගෙනයාමට නොහැකි වූයේ නැවතත් චන්ද්‍රිකා පාර්ලිමේන්තුව විසිරුවා හැරි නිසාය.

අනෙක් අතට වික්ටර්ගේ ජිනීවා නඩුවෙන් සාපරාධී අපහාස නීතිය අභියෝග කර නොතිබිණි. ඉන් අභියෝග කර තිබුණේ සාපරාධී අපහාස නඩු පැවරීම සඳහා නීතිපතිට ඇති පරම බලය වැරැදි ආකාරයට භාවිත කර තිබීමය. නඩු තීන්දුවෙන් වික්ටර් අයිවන්ගේ මානව හිමිකම් කඩවී ඇති බව කියා තිබුණත් සාපරාධී අපහාස නීතිය ඉවත් කරන ලෙස ඉල්ලා නැත.

පුදුමයකට මෙය වික්ටර් කතා කරන්නේ සාපරාධී අපහාසනීතිය ගැනය. පුවත යනු පවතින දේය. නොපතින දේ පුවත නොවේ. එනම් එය බොරුවකි. යම් පුද්ගලයෙකු කරුණු අතින් සත්‍ය නොවූ සිද්ධියක් හෝ සිද්ධීන් අඩංගු කොට විවේචන සහිතව ප්‍රකාශන කරන්නේ නම් එය අපහාසයකි. ඒ අනුව විකෘති කරන ලද කරුණු දක්වීම් මගින් මෙරට මාධ්‍ය සංවිධානයන්ට අපහාසයක් කර ඇත. අගතියක් කර ඇත. වික්ටර් ස්වයං නියාමන ගැනද කතාකරයි. එහෙයින් රාවයේම ආචාරධර්ම පද්ධතිය උපුටා දක්වමි. වික්ටර්ගේ ලිපියෙන් රාවයේම ආචාරධර්ම පද්ධතියේ පළමු මූලධර්ම තුනම උල්ලංඝනය කර ඇත. එනම් (1) සත්‍ය ගරුක බව - නිවැරදිව හා සත්‍යගකරුකව වාර්තා කිරීමට බැඳී සිටිමු. (2) අවංකබව - කිසිදු පාර්ශවයකට අගතියක් නොවන පරිදි අවංකව කටයුතු කරමු. (3) අපක්ෂපාතී බව - පෞද්ගලික රුචි අරුචිකම් වලින් බැහැරව සියලු පාර්ශවයන්ගේ අදහස් වාර්තා කරමු.